ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම - 2024
--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් (SOEs) සඳහා ආයතනික පාලනය සහ මෙහෙයුම් අත්පොත පිළිබඳ මාර්ගෝපදේශය	අත්පොතේ 6.7 වගන්තියට අනුව, සමාගම 2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 5,795,390,925ක ස්ථාවර වත්කම් පිළිබඳ වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදු කර නොතිබුණි.	අවසන් වූ 2024 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් පිළිබඳ භෞතික සත්‍යාපනය කාර්යය සමාගම විසින් බේකර් ටිලී සහ සමාගමට (Baker Tilly & Company) පවරන ලදී. ඔවුන් ක්ෂේත්‍ර කටයුතු සහ සැසඳීම් සම්පූර්ණ කර ඇත. සමාගම අවසන් වාර්තාව බලාපොරොත්තුවෙන් සිටින අතර එය විගණනයට ඉදිරිපත් කරනු ලැබේ.	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශයේ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ) රාජ්‍ය ව්‍යවසායන් (SOEs) සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම IV	මණ්ඩලයේ අනුමැතියට පෙර නව මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම විගණන කමිටුවේ (AC) විෂය පථය යටතේ සිදු කළ යුතුය. කෙසේ වෙතත්, මණ්ඩලයේ අනුමැතියට පෙර සමාගම මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.	නිරීක්ෂණය නිසි පරිදි සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට පෙර සමාලෝචනය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණන කමිටුවට ඉදිරිපත් කිරීමේ වැදගත්කම සමාගම විසින් පිළිගනු ලැබේ. ඒ අනුව, 2025 මූල්‍ය වර්ෂයේ සිට යහපාලන පිළිවෙත්වලට අනුකූලව මෙම ක්‍රියාවලිය නිසි පරිදි අනුගමනය කරන බව සහතික කිරීමට අවැසි පියවර ගනු ලැබේ.	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශයේ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ) 2015 මැයි 25 දිනැති අංක PED 01/2015, 2016	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින්	ඔබගේ විමසුමේ සඳහන් නිලධාරීන් 5 දෙනා 05	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ

	ඔක්තෝබර් 27 දිනැති අංක PED 1/2015(i) සහ 2022 ජනවාරි 14 දිනැති අංක PED 01/2015 (ii) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම රාජ්‍ය ව්‍යාපාරයක HM 1-1 කාණ්ඩයට සමාන හෝ වැඩි තනතුරක් දරන නිලධාරියෙකුට මසකට ලීටර් 115 සිට 145 දක්වා ප්‍රමාණයකට සමාන ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හිමිකම් ඇත. පූර්ව විධිවිධානයට පටහැනිව, ඉහත උපරිම සීමාව සමග සැසඳීමේ දී, 2024 වර්ෂය සඳහා නිලධාරීන් 5 දෙනෙකු රුපියල් 3,105,601ක වටිනාකමකින් යුත් ඉන්ධන ලීටර් 7655ක් වැඩිපුර භාවිත කර තිබුණි.	ශ්‍රේණිය (JG 05) සහ ඊට ඉහල මට්ටමේ සේවකයින් වේ. සමාගමේ මෝටර් රථ ප්‍රතිපත්තියට අනුව, සමාගම විසින් සමාගමේ වාහන ලබා නොදෙන බැවින් මෙම සියලුම සේවකයින් තම ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා ඉන්ධන දීමනාවක් සඳහා සුදුසුකම් ලබයි.	මාර්ගෝපදේශයේ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	2015 මැයි 25 දිනැති අංක PED 01/2015, 2016 ඔක්තෝබර් 27 දිනැති අංක PED 1/2015(i) දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ	නිල වාහනයක් හිමි නිලධාරියෙකුට නිල වාහනය භාවිතා කිරීමට හෝ රු. 50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාවක් ලබා ගැනීමට හැකිය. කෙසේ වෙතත්, එවැනි නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා නොදිය යුතුය. ඉහත චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ,		
		(i) සමාගම විසින් 2020 වර්ෂයේ සිට සේවකයින් හත් දෙනෙකු සඳහා රු. 201,600 සිට රු. 390,360 දක්වා පරාසයකින් යුත් මාසික ප්‍රවාහන දීමනාවක් සහ	ඉස්මතු කරන ලද නිරීක්ෂණ සම්බන්ධයෙන්, සමාගම විසින් පහත පැහැදිලි කිරීම ගෞරවයෙන් ඉදිරිපත් කරනු ලැබේ. සමාගමේ ප්‍රතිපත්තිය	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශයේ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

සේවකයින් තිදෙනෙකු සඳහා රු. 50,000 ක මාසික රියදුරු දීමනාවක් ලබා දී තිබුණි. 2024 වර්ෂයේදී වැඩිපුර ගෙවන ලද මුළු මුදල රු. මිලියන 20.8ක් විය.	ප්‍රකාරව, සමාගම විසින් නඩත්තු කරනු ලබන වාහන කිසිදු සේවක කාණ්ඩයක් සඳහා ලබා නොදේ. රියදුරු දීමනාව ගෙවනු ලබන්නේ, සමාගමෙන් වැටුප් ගෙවන රියදුරෙකු ලබා දී නොමැති නමුත් සමාගමෙන් වැටුප් ගෙවන රියදුරෙකු ලබා ගැනීමට සුදුසුකම් ලබන කාර්ය මණ්ඩලයට පමණි. මෙය 2024 ජනවාරි 16 වන දින පැවති රැස්වීමේදී අනුමත කර තිබුණි.	
(ii) වාහන දීමනාව සඳහා හිමිකම් නොමැති සේවකයින් දස දෙනෙකුට සමාගම විසින් රුපියල් 21,600 සිට රුපියල් 77,220 දක්වා මාසික ප්‍රවාහන දීමනාවක් 2020 වර්ෂයේ සිට ලබා දී තිබුණි. 2024 වර්ෂය සඳහා ගෙවන ලද මුළු දීමනාව රුපියල් මිලියන 7.8 කි.	ඉස්මතු කරන ලද නිරීක්ෂණ සම්බන්ධයෙන්, සමාගම විසින් පහත පැහැදිලි කිරීම් ගෞරවයෙන් ඉදිරිපත් කරනු ලැබේ. සමාගමේ ප්‍රතිපත්තිය ප්‍රකාරව, සමාගම විසින් නඩත්තු කරනු ලබන වාහන කිසිදු සේවක කාණ්ඩයක් සඳහා ලබා නොදේ. රියදුරු දීමනාව ගෙවනු ලබන්නේ සමාගමෙන් වැටුප් ගෙවන රියදුරෙකු ලබා දී නොමැති නමුත් සමාගමෙන් වැටුප් ගෙවන රියදුරෙකු ලබා ගැනීමට සුදුසුකම් ලබන කාර්ය මණ්ඩලයට පමණි. මෙය 2024 ජනවාරි 16 වන දින පැවති රැස්වීමේදී අනුමත කර තිබුණි.	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශයේ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

(ඉ) 2015 මැයි 25 දිනැති අංක PED 2/2015 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	නේවාසික දුරකථන, පෞද්ගලික ජංගම දුරකථන හෝ අන්තර්ජාල පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය උපකරණ සහ උපාංග මිලදී ගැනීමේ පිරිවැය නිලධාරීන් විසින් පෞද්ගලිකව දැරිය යුතුය. එවැනි උපකරණ සඳහා වන වියදම් අදාළ ව්‍යාපාර විසින් ප්‍රතිපූරණය නොකළ යුතුය. කෙසේ වෙතත්, ඉහත චක්‍රලේඛයට පටහැනිව, 2024 වර්ෂයේදී ජංගම දුරකථන මිලදී ගැනීම සඳහා නිලධාරීන් හය දෙනෙකු වෙනුවෙන් සමාගම විසින් රු. 440,241ක මුදලක් ගෙවා තිබුණි.	රාජකාරි කටයුතු සඳහා භාවිත කිරීමට සීමිත කාර්යමණ්ඩල සාමාජිකයින් පිරිසකට ඔවුන්ගේ කාර්ය භාරය මත පදනම්ව ජංගම දුරකථන ලබා දී ඇති අතර, දුරකථන ඇන්ඩ්‍රොයිඩ් (Android) හෝ IOS උපාංග විය යුතු අතර රාජකාරි වේලාවෙන් බැහැරව දුරස්ථව වැඩ කිරීමට ඉඩ සලසමින් ක්ලවුඩ් (Cloud) පහසුකම සහිත යෙදුම් සඳහා භාවිතා කරනු ලැබේ. ජංගම දුරකථන සැපයීමේ තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ අතර, මුල් ඉන්වොයිසි වාර්තා තබා ගැනීමේ පරමාර්ථය සඳහා තබා ගනු ලැබේ. ඩයලොග් ආසිආටා සමාගම (Dialog Axiata PLC) වෙතින් ලබා දෙන ජංගම දුරකථන වට්ටම් මගින් දුරකථන වියදම් හිලව් කර සමස්ත සන්නිවේදන පිරිවැය අඩු කරනු ලබයි.	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශය සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කළ යුතුය.
(ඊ) 2024 දෙසැම්බර් 23 දිනැති අංක PED 03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය	චක්‍රලේඛයේ 1.2(II) ඡේදයට අනුව, 2023 මූල්‍ය වර්ෂය තුළ ලාභ ඉපයූ වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වලට එක් සේවකයෙකු සඳහා රු. 20,000ක ප්‍රසාද දීමනාවක් යෝජනා කළ හැකිය. ඉහත විධිවිධානවලට පටහැනිව, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සමාගම විසින් 2024 ජනවාරි මාසයේදී ගෙවන ලද සාමාන්‍ය	මූල්‍ය පුරෝකථනය, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ඇතුළුව වසර පහක කාලයක් සඳහා වූ උපායමාර්ගික සැලැස්ම මණ්ඩලය විසින් අනුමත කර 2023 මාර්තු 14 වන දින රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. දෙපාර්තමේන්තු අනුව සැකසූ උපායමාර්ග මෙම සැලැස්ම මගින් ආවරණය කරන අතර, අරමුණු ළඟා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගකිව යුතුය. දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් පුද්ගල ලකුණු	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශය සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කළ යුතුය.

	කාර්ය සාධන ප්‍රසාද දීමනාව වන රු. 685,767ට අමතරව, සේවකයෙකු සඳහා රු. 100,000ක වසර අවසාන ලාභ ප්‍රසාද දීමනාවක් ලබා දී ඇත. සමාලෝචිත වර්ෂය තුළ ලාභ ප්‍රසාද දීමනාව වශයෙන් රුපියල් 860,000ක මුළු මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.	කාඩ්පත් ඇගයීම් හා සම්බන්ධ කර ඇති අතර, ඇගයීම් ශ්‍රේණිගත කිරීම් මත පදනම්ව ප්‍රසාද දීමනා ගෙවනු ලැබේ. ප්‍රසාද ගෙවීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතර එයට සමාගමේ ආදායම සහ මූල්‍ය කාර්ය සාධනය ඇතුළත් වේ.

1.6 **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 මාර්තු 29 දිනැති SEC/2023/E/01 චක්‍රලේඛය සහ 2023 අප්‍රේල් 06 දිනැති SEC/2023/E/02 චක්‍රලේඛය පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කිරීමේදී, සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින් 8 දෙනෙකුට ලබා දී ඇති සමස්ත රු. 8,054,660ක ඉන්ධන දීමනා සහ 2023 වර්ෂයේදී සේවකයින් 8 දෙනෙකු සඳහා රු. 7,212,221ක ඉන්ධන දීමනා සමාගම විසින් සැලකිල්ලට ගෙන නොතිබුණි.	ජාතික විගණන කාර්යාලයේ පෙර නිරීක්ෂණවලට ප්‍රතිචාර වශයෙන්, එවැනි අඩු කිරීම් අදාළ වන සේවකයින් වෙනුවෙන් 2025 අප්‍රේල් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන දීමනා සඳහා APPIT අඩු කිරීම් ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. රාජකාරියට අදාළ වැඩ සඳහා ඉන්ධන භාවිත කරන සේවකයින්ට මෙය අදාළ නොවේ, කෙසේ වෙතත්, ඉන්ධන පිරිවැය ප්‍රතිපූරණය කිරීම පමණක් සිදු කෙරේ.	සමාගම විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛවල අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2,060.4ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 2,161.3ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 100.9 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ ශුද්ධ මූල්‍ය ආදායම රු. මිලියන 210.9 කින් අඩුවීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් පෙර වර්ෂ දෙක හා සසදා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් ඇඟයීමට ලක්කර පහත පරිදි දක්වා ඇත.

	ගණන රු. මිලියන			වෙනසේ ප්‍රතිශතය		
දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා	**2024**	**2023**	**2022**	**2024**	**2023**	**2022**
ගනුදෙනුකරුවන් සමග එලඹෙන ලද ගිවිසුම්වලින් ලද ආදායම	2,018	1,999	1,444	0.9%	38.4%	-10.6%
විකුණුම් පිරිවැය	256	319	319	-19.7%	-	1%
දළ ලාභය	1,762	1,679	1,124	4.9%	49.3%	-13.4%
මෙහෙයුම් ලාභය/(අලාභය)	1,279	1,169	656	9.4%	78.2%	-29%
මූල්‍ය ආදයම්	785	994	520	-21%	91.1%	71%
මූල්‍ය වියදම්	4.5	2.7	17.2	66.6%	-84.3%	-38.5%
ආදායම් බදු වියදම්	620	620	577	-	7.4%	380%
වර්ෂය සඳහා ලාභය	1,439	1,540	582	-6.5%	164%	-46%

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන අනුපාතයන් පූර්ව වර්ෂයන් සමග සැසඳීම පහත පරිදි වේ.

අනුපාතයන්	2024	2023	2022
ලභාදයිතා අනුපාත			
දළ ලාභ අනුපාතය	87%	83.9%	77.8%
ශුද්ධ ලාභ අනුපාතය (PBT)	102%	108%	80%
ශුද්ධ ලාභ අනුපාතය (PAT)	71.3%	77%	40%
යෙද වූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ (ROCE)	14.6%	16%	9.60%
ස්කන්ධය මත ප්‍රතිලාභ	10.8%	12.15%	4.7%
වත්කම් මත ප්‍රතිලාභ	13.8%	14.78%	8.49%
ද්‍රවශීලතා අනුපාතයන්			
ජංගම අනුපාතය (වාර ගණන)	8.85	5.60	1.14
ක්ෂණික අනුපාතය (වාර ගනන)	8.84	5.59	1.13
තෝලන අනුපාත			
පොළී ආවරණ අනුපාතය	447.67	794.04	66.16
කාර්යක්ෂමතා අනුපාත			
වත්කම් පිරිවැටුම	13.55%	13.67%	10.42%
වෙළඳ වටිනාකම් අනුපාත			
කොටසක ඉපයීම	9.07	9.71	3.67
කොටසක පොත් අගය	83.45	79.90	77.07

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතාවයන්

විගණන නිරීක්ෂණය	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ) සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ එහි සහෝදර සමාගම වන ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම ((LGLL) මගින්, බෙදාහැරීම සඳහා ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් මෙට්‍රික් ටොන් එකක් පරිහරණය සඳහා මෙහෙයුම් ගාස්තු හුවමාරු කරමින් LP ගෑස් ගබඩා පහසුකම් සැලසීම සහ LP ගෑස් පිරවීමේ පහසුකම් ලබා දීම වේ. කෙසේනමුත්, සමාගම සේවා සැපයුම් වල නියමයන් සහ කොන්දේසි පනවමින් LGLL සමග විධිමත් ගිවිසුමකට ඇතුළත් නොවීය.	ශ්‍රී ලංකා රජය අත්පත් කර ගැනීමෙන් පසු බලාත්මක වූ ෂෙල් ගෑස් ලංකා සමාගම සහ ෂෙල් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම අතර ප්‍රතිදාන ගිවිසුමක් යටතේ සමාගම ක්‍රියාත්මක වේ.වෙළඳපොළ තත්ත්වයන් පදනම් කර ගෙන ගිවිසුම කාලානුරූපීව සංශෝධනය කර ඇත.වර්තමාන අස්ථිත්වයන් යටතේ ගිවිසුම නැවත ක්‍රියාත්මක කිරීමට සමාගම සූදානම් වේ.	සමාගම සේවා සැපයුම් වල නියමයන් සහ කොන්දේසි පනවමින් LGLL සමග විධිමත් ගිවිසුමකට ඇතුළත් විය යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතාවයන්

විගණන නිරීක්ෂණය	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
වර්ෂ 10 ක කාලසීමාවක් සඳහා හම්බන්තොට වරාය පරිශ්‍රයේ LP ගෑස් බෑමේ සහ ගබඩා පහසුකම් බදු දීමට 2013 නොවැම්බර් 20 දින සමාගම ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග ගිවිසුමකට එළඹෙන ලදී.වර්ෂ 08 ක් සඳහා මුළු බදු කුලිය වූ රුපියල් මිලියන 668.55 (බදු ඇතුළත්ව) ගෙවා ඇති අතර ඉතිරි වර්ෂ දෙක සඳහා මුළු බදු කුලිය වූ රුපියල් මිලියන 233.84 (බදු හැර) 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වේ.මෙම ටර්මිනලය සතුව LP ගෑස් මෙට්‍රික් ටොන් 2,700 ක් ගබඩා කිරීමේ ධාරිතාවයක් ඇත. කෙසේ නමුත්,සමාගම හම්බන්තොට පිරවුම් යන්ත්‍රාගාරයේ මෙහෙයුම් කටයුතු 2021 පෙබරවාරි 11 නවතා දැමීමට තීරණය කරන ලදී. 2013 නොවැම්බර් 20 සිට 2021 පෙබරවාරි 11 දක්වා එකතුව මෙට්‍රික් ටොන් 10,075 වූ නැව් ගෑස් තොග 06 ක් පමණක් මෙහෙයුම් කර ඇති බව නිරීක්ෂණය කරන ලදී. එමනිසා, ආයෝජනය සමග සසඳන කල ඉහත පහසුකම වර්ෂ 08 ක කාලසීමාවක දී සම්පූර්ණයෙන් උපයෝජනය කර නොමැත.	2013 දී හම්බන්තොට වරායේ LPG ඉන්ධන ඉවත් කිරීමේ සහ ගබඩා කිරීමේ පහසුකමක් සඳහා සමාගම SLPA සමඟ වසර 10 ක කල්බදු ගිවිසුමක් අත්සන් කළේය. සමාගම රුපියල් මිලියන 668.55 ක් ගෙවා ඇති අතර 2021 පෙබරවාරි මාසයේ මෙහෙයුම් අත්හිටුවීම හේතුවෙන් ඉතිරි රුපියල් මිලියන 233.84 තවමත් නොගෙවා ඇත. HIPG දෝෂයට දොස් පැවරීමට උත්සාහ කළ නමුත් හිමිකම් ප්‍රතික්ෂේප කළේය. කල්බදු ගිවිසුම කල් ඉකුත් වූ විට පහසුකම HIPG වෙත ආපසු ලබා දෙනු ලැබේ. සම්පූර්ණ නොගෙවූ කල්බදු මුදල සඳහා ප්‍රතිපාදනයක් 2024 දී සිදු කරන ලදී.	නොගෙවූ බදු මුදල, ප්‍රමාද ගෙවීම් පිළිබඳ සහ ගිවිසුම් කොන්දේසි පිළිබඳ තොරතුරු උචිත තීරණයක් ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාගම විසින් 2021 වසරේදී ඔක්සිජන් පිරවුම්හලක් ඉදිකිරීම සඳහා සහ/හෝ අතිරේක ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) මෙහෙයුම් ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් හෝ වෙනත් අදාළ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරිමට කෙරවලපිටියේ අක්කර 22ක ඉඩමක් සහ ගොඩනැඟිල්ලක් සඳහා සම්පූර්ණ බදු දීමනාවෙන් කොටසක් ලෙස රුපියල් මිලියන 500ක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ සිදුවෙමින් පවතින ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් ඉහත ඉඩම සමාගමට බදු දීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට කැබිනට් අනුමැතිය සමාලෝචිත වර්ෂය දක්වා ලබා දී නොතිබුණි. එබැවින් ඉහත ගෙවීමෙන් සමාගම මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි.උපයෝජනය නොකරන ලද ඉඩම වල ආවස්ථික පිරිවැය ප්‍රමාණාත්මක වූ අතර ඇස්තමේන්තු කරන ලද අහිමි වූ ආයෝජන ප්‍රතිලාභ රුපියල් 143,000,000 ක් (භාණ්ඩාර බිල්පත් වල අනුපාතය පදනම්ව) විය. එය මූල්‍ය අනුපාත කෙරෙහි ඍණාත්මකව බලපා තිබුණි.	කෙරවලපිටිය පිහිටා තිබෙන අක්කර 22 ක ඉඩම සහ ගොඩනැගිල්ල යෝජිත බදු දීමේ කොටසක් ලෙස ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට(SLLDC) සමාගම 2021 දී රුපියල් මිලියන 500 ක් ගෙවා ඇත.මෙහි මූලික අරමුණ වන්නේ ඔක්සිජන් පිරවුම් හලක් හෝ LP ගෑස් මෙහෙයුම් ව්‍යාපෘතියක් වේ.කෙසේනමුත්, වසංගතය ස්ථාපිත වීමත් සමග ව්‍යාපෘතියේ කඩිනම් බව අඩු විය. 2025 ජනවාරි මාසයේදී සමාගම අත්තිකාරම් ගෙවීමත් ඇතුළත්ව SLLDC සමග වර්ෂ 50 ක බදු ගිවිසුමකට අත්සන් කරන ලදී.අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් සහ සංවර්ධනය නොවූ දේපළ නොසලකා, පිරිවැය ඉතිකිරීම් සඳහා වැඩ බිමෙහි ගොඩනැගිලි භාවිතා කිරීමට සමාගමට ඉඩ ලබා දෙන ලදී. අත්තිකාරම් මුදලේ ආවස්ථික පිරිවැය රාජ්‍ය අංශය තුළ පවතී.	අදාළ අධිකාරීත්වයන්ගේ අනුමැතිය මත අදහස් කරන අරමුණ සඳහා සමාගම මෙම දේපළ භාවිතා කල යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයෙහි 4.2.2 සහ 4.2.3 හි උපදෙස්වලට අනුකූලව, ප්‍රසම්පාදන අස්තිත්වය විසින් අපේක්ෂිත ප්‍රසම්පාදන සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර, ආරම්භයේ සිට අවසානය දක්වා එක් එක් ප්‍රසම්පාදන කටයුත්තෙහි පියවර	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීමක් සිදු කර නොමැත.	සමාගම විසින් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර විස්තර කරමින් කාලානුක්‍රමික අනුපිළිවෙල සහිතව ප්‍රසම්පාදන කාලසටහන සකස් කළ යුතුය.

කාලානුක්‍රමික අනුපිළිවෙලට විස්තර කරමින් ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ සිදු කරන ලද රු. මිලියන 148.1ක වටිනාකමකින් යුත් ප්‍රසම්පාදන කටයුතු 05ක් සඳහා එකී ප්‍රසම්පාදන සැලසුම් සහ ප්‍රසම්පාදන කාලසටහන සකස් කර නොතිබුණි.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 මගින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර (SOEs) සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 3.1 සහ 3.2(i) වගන්ති ප්‍රකාරව, සමාගම විසින් තම සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සහ වැටුප සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා ලිමිටඩ් (LGTLL) රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත ප්‍රකාරව එහි සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය (SOR) සහ වැටුප සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාර අනුමැතියෙන් නිදහස් කර ඇත. සමාගම විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති අතර දැනට සේවක සංඛ්‍යාව සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගනිමින් සිටී. නවතම වැටුප් සංශෝධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2024 ජනවාරි 16 වන දින ලබා දෙන ලදී.	සමූහය සහ සමාගම අතර පරිපාලිත ප්‍රතිපත්තියක් නොමැති බැවින් සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයන්හි අවශ්‍යතා අනුව කටයුතු කළ යුතුය.
(ආ) 2022 ඔක්තෝබර් 06 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 06/2022හි විධිවිධානයන්ට අනුව, සේවකයින් වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විට විශ්‍රාම යා යුතුය. කෙසේ වෙතත්, චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, 2024 ඔක්තෝබර් වන විට වයස අවුරුදු 60 සම්පූර්ණ කළ මානව සම්පත් කළමනාකරණ ප්‍රධානියා 2025 ජූලි 31 දින වන විටත් කොන්ත්‍රාත් පදනමක් මත සේවයේ යොදවා තිබුණි.	තම මුල් කොන්ත්‍රාත්තුව රඳවා ගනිමින් ලිට්‍රෝ කාර්ය මණ්ඩලය වයස අවුරුදු 60 දී විශ්‍රාම යනු ලැබේ. වයස අවුරුදු 60ට පසු, ඔවුන්ට තම රැකියාව දිගටම කරගෙන යා හැකිය. රැකියාව අඛණ්ඩව කරගෙන යාම සඳහා භාණ්ඩාගාරයේ සහ SOERUහි ලිපි මගින් දක්වා ඇති පරිදි සමාගම විසින් සේවකයින්ට අලුතින් නිශ්චිත කාලයකට කොන්ත්‍රාත්තු ලබා දෙන අතර, බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය වේ.	සමාගම විසින් රාජ්‍ය ව්‍යාපාර (SOE) පිළිබඳ මාර්ගෝපදේශය සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහ පාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
අත්පොතේ 6.6 වගන්තිය අනුව, මුල්‍ය වර්ෂය අවසන් වී මාස පහක් (05) තුළ සමාගමේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභා ගත කල යුතු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුල්‍ය වර්ෂය අවසන් වී දින හැටක් (60) ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේනමුත්, සමාගම 2023 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට සභා ගත කර නොමැති අතර 2024 වර්ෂය සඳහා මුල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සමාගමේ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව SLIC සහ මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරේ. 2024 වර්ෂය සඳහා වන කෙටුම්පත් ගිණුම් 2025 අප්‍රේල් 11 දින රජයේ විගණක වෙත ඉදිරිපත් කර ඇත.	සමාගම රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කල යුතුය.

4.2 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
අ.) ආයතනික පාලනය පිළිබද මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය අනුව, විගණන කමිටුව මාස තුනකට අවම වශයෙන් එක් වරක් රැස් විය යුතු අතර නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම පහසු කිරීමට රැස්වීමේ වාර්තා සටහන් සමග එහි නිර්දේශයන් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. කෙසේනමුත්, විගණන කමිටු රැස්වීම් දෙකක් පමණක් 2024 වර්ෂයේ පවත්වා තිබුණි.	නිරීක්ෂණය පිළිගතිමි.අත්පොතේ 4.2 වගන්තිය යටතේ සමාගම අවශ්‍යතාවයන් අනුව කටයුතු කරනු ලැබේ.ඒ අනුව, නියමිත වාර ගණන සමග අනුකූලව,සමාගම් දෙක සඳහා 2025 වර්ෂය තුළ අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වීමට වග බලා ගැනීමට සැලසුමක් ක්‍රියාත්මක කර ඇත.	සමාගම රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කල යුතුය.
(ආ.) ආයතනික පාලනය පිළිබද මාර්ගෝපදේශයේ 4.2 (i) වගන්තිය අනුව, විගණන කමිටුව විගණන කමිටු ප්‍රඥප්තිය මගින් මාර්ගෝපදේශ ලබා ගත යුතුය. විගණන කමිටු ප්‍රඥප්තිය නොමැති අවස්ථා වලදී, මණ්ඩලයේ අනුමැතිය සමග IV වන ඇමුණුමේ දක්වා තිබෙන ආදර්ශ ප්‍රඥප්තිය යොදා ගත යුතුය. කෙසේනමුත්, විගණන කමිටු ප්‍රඥප්තිය සංවර්ධනය කර හෝ ආදර්ශ ප්‍රඥප්තිය මණ්ඩලයේ අනුමැතිය සමග යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.	සමාගම නිරීක්ෂණය පිළිගන්නා අතර වර්තමානයේ, විගණන කමිටු ප්‍රඥප්තිය කෙටුම්පත් කරමින් පවතින අතර කෙටි කාලයකින් අවසන් කරනු ලැබේ.අවසන් කිරීමෙන් පසු, අත්පොතේ 4.2 (i) වගන්තියේ අවශ්‍යතාවයන් සමග අනුගත වීම සහතික කිරීමට මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන අතර පාලන රාමුව සහ අභ්‍යන්තර පාලන පරිසරය ශක්තිමත් කරනු ලබයි.	සමාගම රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුගමනය කල යුතුය.